32

# උම්මත් ගැන වූ දැක්ම

وَمَا كَانَ النَّاسُ إِلاَّ أُمَّةً وَّاحِدَةً فَاخْتَلَفُوْا...

**"(මුලදී) මනුෂ්‍යයින් (සියලු දෙනා) එකම සමාජයක් විය. පසු ව (එකිනෙකට වෙනස් දහම් පිළිවෙත් සොයා ගනිමින්) ඔවුහු භේද භින්න වූහ....ම (10 යූනුස් : 19)**

'උම්මත්' යන පදයෙහි වචනාර්ථ වශයෙන් 'මම, සමාජය' යන අරුත් පොදුවේ භාවිත වූව ද සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ විද්වතුන් එය නිර්වචනය කරන්නේ, පොදු අරමුණක් සහිත ව එකමුතු වූ සමාජයක් යනුවෙනි. එනම් පාරම්පරික සිරිත්-විරිත් මත, එක ම ප්‍රතිපත්තියක් අනුව, පොදු අරමුණක් හෝ ඉලක්කයක් මත, එක ම අභිලාෂයක් මත, එක ම ප්‍රදේශයක ජීවත් වීම, එක ම ස්වරූපයක් පෙන්වීම, ආදී වශයෙන් එක් පොදු පදනමක් මත පිහිටා සංකේන්ද්‍රණය වන ජන සමූහයක් මෙහි දී අදහස් වේ.

ඉස්ලාම් සම්ප්‍රදාය අනුව ඉස්ලාම් ආගමික සමාජය ම ඉහත නිර්වචනයට ඇතුළත් වේ. විවිධ ජාතීන් ජීවත් වන දේශයකට අයත් ජන සමූහයක් සේ සලකා මෙහි දී අප 'උම්මත්' ගැන පැහැදිලි කරගත යුත්තේ, ආගමික හා සමාජීය යන පැතිකඩ දෙක ම සැලකිල්ලට බඳුන් කරමිනි.

අල් කුර්ආනයෙහි උම්මත් යන වචනය වාර 50කට වඩා වැඩි ස්ථානවල යෙදී තිබේ. ඒවා සියල්ලෙහි සමස්ත අර්ථය ගෙන බැලූ විට මුල් යුගයේ දී එක ම මවකට හා එක ම පියකුට දාව ඉපදුණු එක ම දරු කැලක් සේ පොදු ප්‍රතිපත්ති හා 'උම්මතයක්' ලෙස මිනිසා ජීවත් වුණු බවත් ක්‍රමයෙන් අදහස්වල විවිධත්වය, නිසා වෙන් වෙන් කණ්ඩායම්වලට බෙදී වෙන් වූ බවත් පැහැදිලි වේ. මෙලෙස බෙදී වෙන් වුණු කොටස් 'ලාඉලාහ ඉල්ලල්ලාහු' යන කලිමාව මගින් එකමුතු කිරීමේ කාර්යය අල්ලාහ් විසින් නබිවරුන්ට පවරා ඇත.

"මිනිස්සුන් සියල්ල ම (ආරම්භයේ දී එක ම ආශාවන්ගෙන් හා රුචි-අරුචිකම්වලින් යුක්ත වූ) එක ම උම්මත් වේ. පසු ව (තමන් තුළ ඇති ඊර්ෂ්‍යා, ක්‍රෝධ ආදිය හේතුවෙන්) බොහෝ කණ්ඩායම් ලෙස වෙන් වූහ." (10 ඃ යූනුස් 19)

දූතයෙනි! පාරිශුද්ධතාවෙන් තිබෙන දේ අනුභව කරන්න. තව ද පුණ්‍යකර්මයන් කරන්න. නුඹලා කරන දේ ගැන මම අවබෝධයෙන් සිටිමි. තව ද මෙය එකම උම්මතය වෙයි. එය තමා ඔබේ උම්මතය වන්නේ. මා ඔබේ රබ් වේ. එමනිසා මට බිය වෙන්න. (23ඃ අල් මුඃමිනූන් 51,52)

මිනිසුන්ගේ භේද තුරන් කර අල්ලාහ් පමණක් විශ්වාස කරන උම්මත් ලෙස එකතු වීම අල්ලාහ්ගේ දායාදයට පාත්‍ර වන කරුණක් බව අල් කුර්ආනය පවසයි.

"අල්ලාහ් කැමැති වුණා නම් නුඹලා එක ම උම්මත් ලෙස පත් කරයි. එසේ ම මොහු කැමැති වුණු අය තමන්ගේ දයාව තුළට ඇතුළු කරයි." (42ඃ අෂ් ෂූරා 8)

"නුඹලාගේ දෙවියා සිතුවා නම් මිනිසුන් සියලු දෙනා ම එක ම උම්මත් ලෙස පත් කරයි. (ඒවගේ කැමැති වුණේ නැත.) ඔවුන් ආභ්‍යන්තරික වශයෙන් ම වෙනස්කම් සහිත ව සිටිති. ඔවුන්ගෙන් ඔබේ ම දෙවියාගේ දයාවට පත් වූවන් හැර." (11ඃ හූද් 118)

ඉස්ලාමියක සාමාජවිද්‍යා දර්ශනිකයකු වන ඉමාම් ඉබ්නු හල්දූන්, පාරාබි, රෂීද් රිලා යනාදි පුද්ගලයින් උම්මත් ගැන විග්‍රහ කරන විට දී මුස්ලිම් උම්මත් යන වදන " ඉස්ලාම් ධර්මයට අයත් අය යන පොදු ලක්ෂණය ද මධ්‍යස්ථ තත්ත්වය, කුසල් කරන්නට අණ කර අකුසල් වළක්වා ගන්න. මහජනතාවට වග කියන සුවිශේෂී ගුණාංග සහිත ව තනි පුද්ගලයන් එකතු වීම යනුවෙන් නිර්වචනය කරයි. මෙය මුස්ලිම් උම්මත් ගැන අල් කුර්ආන්හි වැකි තුළින් ලබාගත් නිර්වචනය වේ.

"මිනිස්සුන්ට යවන ලද විශිෂ්ට උම්මත් ලෙස නුඹලා සිටින්නෙහු. නුඹලා කුසලය අණ කරන්ණෝ ය; අකුසල වළක්වාලන්ණෝ ය." (3ඃ ආල ඉම්රාන් 110)

"පොදු ජනතාවට වග කියන, සාධාරණ ජන කණ්ඩායමක් (උම්මතයන්) ලෙස නුඹලා පත් කළෙමු." (2ඃ අල් බකරා 143)

ඉහත සඳහන් කළ නිර්වචනවලින් මිනිසුන් අතර ඇති වී තිබෙන ජාති, කුල,ආගම්, පාට භේද ආදී කිසි ම දෙයක් නොසලකා "ලාඉලාහ ඉල්ලල්ලාහු මුහම්මදුර් රසූලුල්ලාහ්" යන කලීමාව කියා ඉස්ලාමීය ජීවන ක්‍රමයක් හැටියට පිළිපදින තනි පුද්ගලයා ද මුස්ලිම් උම්මතයන්හි සාමාජිකයකු ලෙස සලකනු ලැබේ.

මුස්ලිම් උම්මත්හි බිහිවීම නබිවරුන්ගේ පියා වන ඉබ්‍රාහීම් (අලෛ) තුමාණන් හා ඉස්මායිල් අලෛහිස්සලාම් තුමාගේ ඉලක්ක ද ඇතුළත් වූ සිහිනය වේ. ඔහු "අල්ලාහ්

යන අප දෙදෙනා ඔබට අවනත වන මුස්ලිම්වරුන් බවට පත් කරනු." යැයි ප්‍රාර්ථනා කළේ ය. ඔවුන් කෑබා ඉදි කරන අවස්ථාවේ දී මෙලෙස ප්‍රාර්ථනා කළ බවට අල් කුර්ආනය පවසයි. මුස්ලිම් උම්මත්හි ප්‍රධානියා වන මුහම්මද් සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් ඉස්මායිල් අලෛහිස්සලාම් තුමාගේ පරම්පරාවෙන් පැමිණීම ද කෑබාව ලෝකයේ තිබෙන සියලු මුස්ලිම්වරුන්ට එක උම්මත් ලෙස එකතු කිරීම ද ඉබ්‍රාහීම් අලෛහිස්සලාම්ගේ ද, ඉස්මායීල් අලෛහිස්සලාම් තුමාණන්ගේ ද ප්‍රාර්ථනා පිළිගත් බවට සලකුණු වේ.

අල් කුර්ආනය හා සුන්නාව උම්මත් යන ව්‍යුහය ආරක්ෂා කර ව්‍යාප්ත කිරීමට විවිධ මගපෙන්වීම ලබා දී ඇත. ඒවායේ සමහරක් පහත දැක්වේ.

1. අල් කුර්ආනය හා සුන්නාව දැඩි ව අනුගමනය කිරීම.
2. නායකත්වයට අවනත වීම.
3. එකමුතුව කරන යුතුකම්වලට වැදගත් තැනක් ලබා දීම.
4. තනි පුද්ගලයන්ට අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමේ නිදහස ලබා දීම.
5. පොදු විෂය කරුණුවල අදහස් ගැන ඇති වන විරෝධතා මතු වන විට පොදු ඒකමතික තීන්දුවකට පැමිණ එය පිළිගැනීම.
6. මුස්ලිම්වරුන් වෙන් කරන මස්ජිද් ඇති නොකිරීම (9: 107) මස්ජිද් මගින් මුස්ලිම්වරුන් එකමුතු කිරීම.
7. සාක්කි දැරීම හා ආදර්ශවත් ව ක්‍රියා කිරීම.
8. සාමය රැකීම.

ඉහත සඳහන් මගපෙන්වීම පිළිගත් උම්මතයෙහි එකමුතුකම රැකීම මුස්ලිමෙකුගේ වගකීම් වේ. නමුත් එක් එක් තනි පුද්ගලයන්ගේ බලය හා ආරක්ෂාව උම්මත්හි බලයේ ආරක්ෂාවේ ද රැඳී ඇත. එලෙස ම අවසාන දිනයේ ඵලය ද උම්මතය සමග එකතු වී ජීවත් වන අයට ලැබෙන්නේ ය.

උම්මතය වෙන්වීම ගැන නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් ප්‍රතික්ෂේප කළේ ය. මගේ උම්මතය කණ්ඩායම් 72කට වෙන් වේ. එහි කණ්ඩායමක් හැර අනිත් සියල්ල ම නිරයට පිවිසෙයි. එම කණ්ඩායම අල් ජමාආ වේ. (ඉබ්නු මාජා)

ඉහත දැක්වූ හදීස් මුස්ලිම් උම්මතයට අවවාදයෙකි. එය වැරදි ලෙස අර්ථ කථනය නොකළ යුතු ය. මුස්ලිම් උම්මත්හි ෂිර්කා, තායිබා, හිස්බ්, ජමාඅත්, මද්හබ්, හරකත්, ජමයියත් යන විවිධ සංවිධාන ඇත. මේවා ඉස්ලාම්හි අකීදාව ද, ෂරීආව ද පිළිගන්නා තුරු නිරයට පිවිසෙන 71හි එකක් ලෙස සලකන්නට නොහැකි ය. උම්මත් යන මූලික ව්‍යුහය පිළිගෙන එහි පැවැත්මට හා ව්‍යාප්තිය උදෙසා ක්‍රියා කරන තනි පුද්ගලයන් ද හා සංවිධාන ද ස්වර්ගය පිවිසෙන කණ්ඩායම් වන අල් ජමාඅතයට අයත් ය.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් උම්මත් ගැන තම දර්ශනය මහත් වූ පෘථුල මනසකින් යුතු ව ඉදිරිපත් කළේ ය. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පැවසූහ. "කවරකු අපගේ සලාතය ඉටු කරන්නේ ද අපගේ කිබ්ලාව පෙරටු ගන්නේ ද අප විසින් කපන ලද දේ අනුභව කරන්නේ ද ඔහු අපට අයත් කෙනකි."

මෙම හදීසය මගින් සුළු සුළු භේද පැවතියත් ඒවා පසුපස හඹා නොගොස් මූලික කරුණුවල දී එකතුවිය යුතු බවට වූ හැඟීම ඇති කරයි.

සමාජ විද්‍යාඥයන් ප්‍රාදේශීය වශයෙන් එකමුතු වූවන් ද උම්මත් හැටියට සැලකීම ගැන පෙර බැලුවෙමු. ඊට අනුකූලව ජාත්‍යන්තර මුස්ලිම් උම්මතයට අයත් යන්නෙන් ද ලාංකික උම්මතය අයත් කෙනෙකු ලෙස ද අපගේ වගකීම් අප නිවැරැදි ව දැන ඉටු කිරීම අපේ ධාර්මික වගකීමකි.

ලාංකික ජනයා වශයෙන් අප අනුගමනය කළ යුතු මගපෙන්වීම් ලෙස පහත සඳහන් දේ දැක්විය හැකි ය.

* මාතෘභූමියට ආදරය කිරීම.
* මාතෘභූමියට විශ්වාසවන්ත වීම.
* ජනතාවගේ හැඟීම්වලට ගරු කිරීම.
* මාතෘභූමියේ එකමුතුකම වෙනුවෙන් කටයුතු කිරීම.
* රට ජාතිය මුහුණ දෙන අභියෝගයවලට එක් ව මුහුණ දීම.
* රටේ නීතිරීතිවලට ගරු කිරීම.
* පොදු කටයුතුවල දී පෞද්ගලික ආගමික හා ජාතිවාදී මානසිකත්වයෙන් මිදී ම.
* සමාජ විරෝධ ක්‍රියා තුරන් කිරීමට සහයෝගය ලබාදීම.
* අන් සමාජ සමග හැසිරීම සම්බන්ධ ව නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් තමන්ගේ ජීවිතයෙන් පෙන්වූ ආදර්ශවත් බව අනුගමනය කිරීම.
* ආගමික සංස්කෘතික අනන්‍යතාව හා ෂරීආවේ සේවාවන් රැකීම.
* සහෝදර ජනතාවත් සමග සහජීවනයෙන් සාකච්ඡා ඇති කිරීම.
* ජාතික භාෂාවන් ඉගෙන ගැනීම.
* පොදු අරමුණු අනුගමනය කිරීම.
* මව්බිම වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම.

ඉහත සඳහන් සියල්ල ම ඉස්ලාමයේ පොදු මගපෙන්විමෙන් ලබා ගත් දේ වේ. මුස්ලිම් උම්මතය මධ්‍යස්ථ උම්මතයක් හැටියට සලකා ක්‍රියා කළ විට අන්‍ය ජාතීන් හා සමාජය තුළ එකමුතුකමින් සහජීවනයෙන් වාසය කිරීම අපහසු නොවේ.

**පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන**

❖ الأُمَّةُ ❖ ابنُ خَلْدُون ❖ الفِرْقَةُ ❖ الطَّائِفَةُ ❖ الحِزْبُ ❖ الجَماعَةُ ❖ المَذْهَبُ
❖ الحَرَكَةُ ❖ الطَّرِيْقَةُ ❖ الجَمْعِيَّةُ

## අභ්‍යාසය

1. උම්මත් යන වචනයෙහි භාෂාමය අදහස් හා නිර්වචනය සඳහන් කරන්න.
2. මුස්ලිම් උම්මතය ගැන නිර්වචනයෙහි සඳහන් වන මුස්ලිම් උම්මතයෙනි වැදගත් ගුණාංග තුනක් දෙන්න.
3. ඉබ්‍රාහීම් අලෛහිස්සලාම් තුමාගේ හා ඉස්මායිල් අලෛහිස්සලාම් තුමාගේ ප්‍රාර්ථනා පිළිගත් බවට සලකුණු මොනවා ද?
4. මුස්ලිම් උම්මතයේ ව්‍යුහය රැකීමට අප විසින් අනුගමනය කළ යුතු මගපෙන්වීම් කුමක් ද?
5. ලාංකික උම්මත් යන්නෙන් අප ළඟ තිබිය යුතු ගුණාංගයන් මොනවා ද?